ශ්‍රී ලංකාවේ නූතන ඓතිහාසික අවධියේ මුස්ලිම්වරුන්ගේ වාණිජ භූමිකාව පිළිබඳ අධ්‍යයනයක්

ඩබ්ලිව්.ජී.ටී.යූ වික්‍රමසිංහ

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
umeshiwickramasinghe85@gmail.com

ප්‍රමුඛ පදඃනූතන ඓතිහාසික අවධිය, මුස්ලිම්වරු, යුරෝපා ජාතීන්, වාණිජ කටයුතු

හැඳින්වීම

ශ්‍රී ලංකාව, ඈත අතීතයේ සිට වාණිජ කටයුතු පිළිබඳ උපායක්‍ෂම වෙළඳ මධ්‍යස්ථානයක් ලෙස ප්‍රසිද්ධත්වයට පත් වූ අතර පුරාතනයේ සිට ම විදේශ ජාතීන් ශ්‍රී ලංකාව සමඟ වාණිජ කටයුතුවල නිරතව සිටිය හ. ඔවුන් අතරින් ලක්දිව සමඟ දූරාතීතයේ සිටම වෙළඳ ගනුදෙනු කළ පුරාණම ජාතියක් වූයේ අරාබිය යි. ඔවුන් අතර ලංකාව ප්‍රසිද්ධව තිබුණේ **'ජසිරතුල්යාක්වූට්'** හෙවත් **'රතු කැට දිවයින'** යන නමිනි.

මෙලෙස ලක්දිව සමඟ දිගු කාලීන වාණිජ සබඳතා පවත්වාගෙන ගිය මුස්ලිම්වරුන් ක්‍රි.ව. 9 - 13 ශතවර්ෂ වන විට ශ්‍රී ලංකාවේ, විශේෂයෙන්ම වෙරළබඩ නගරවල මනාකොට ස්ථාපිතව දේශීය පාලකයන්ගේ ද අනුග්‍රහය ලබමින් රට වැසියන් සමඟ ද සුහද සබඳතා පවත්වමින් සිටියහ. මෙසේ ලක්දිව විසූ මුස්ලිම්වරුන් **'ලංකා යෝනක'**, **'මූවර්'**, **'හම්බන්'**, **'මරක්කල'** වැනි නම්වලින් හඳුන්වනු ලැබිණි. 15 වැනි සියවස අවසාන වන විට මුස්ලිම්වරුන් ලක්දිව තුළ පැහැදිලි වාණිජ අනන්‍යතාවක් ගොඩනගාගෙන සිටි බැව් පෙනේ. මෙම කරුණු ක්‍රි.ව. 10 - 16 වැනි සියවස් අතර ලක්දිවෙන් හමු වී ඇති අරාබි (කුෆික්) ශිලාලේඛනවලින් ද සනාථ වේ. යුරෝපා ආගමනය හමුවේ, මුස්ලිම්වරුන් විසින් මෙතෙක් ඉන්දියානු සාගරය තුළ රැකගත් වාණිජ ආධිපත්‍යයට ද ප්‍රබල බලපෑමක් එල්ල විය. 1505 පැමිණි පෘතුගීසිහු ආසියානු වෙළඳ කටයුතුවල දී මුස්ලිම්වරුන් සිය ප්‍රබල සතුරන් ලෙස සැලකූහ. ක්‍රි.ව. 1698 දී සිදු වූ ලන්දේසීන්ගේ ආගමනයත් සමඟ මුස්ලිම්වරුන්ගේ වාණිජ භූමිකාව තව දුරටත් වෙනස්වීම්වලට ලක් විය. ක්‍රි.ව. 1796 දී බ්‍රිතාන්‍යයන් ලක්දිවට පැමිණෙන විට මුස්ලිම්වරු ඉතා ක්‍රියාශීලී වෙළඳ ප්‍රජාවක් විය. පෘතුගීසීන් හා ලන්දේසීන් මෙන් නොව බ්‍රිතාන්‍යයන් තම පාලන උපක්‍රමයක් ලෙස ඔවුන් කෙරෙහි යහපත් ආකල්පයක් දැක්වීය. එයින් ප්‍රයෝජන ගත් මුස්ලිම්වරුන් සිය වෙළඳ කටයුතු වර්ධනය කරගත් අතර බ්‍රිතාන්‍යයන්ට පක්ෂපාතී ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලද අතර එය පසුකාලීන ගැටලු රැසකට ද හේතුවක් විය.

අධ්‍යයන ගැටලුව

යටත්විජිත අවධියේ මුස්ලිම්වරුන්ගේ වාණිජ භූමිකාව කෙබඳු වී ද? යන පර්යේෂණ ගැටලුව පදනම් කරගනිමින් මෙම අධ්‍යයනය සිදු කෙරේ.

පර්යේෂණ අරමුණු

මෙම අධ්‍යනය සිදු කිරීමේ මූලික අරමුණ බවට පත් වූයේ නූතන ඓතිහාසික අවධියේ මුස්ලිම්වරුන්ගේ වෙළඳාම පිළිබඳවඅධ්‍යයනයක් සිදු කිරීමයි. එමෙන්ම පෘතුගීසි, ලන්දේසි හා බ්‍රිතාන්‍යය යන යුරෝපා ජාතීන්ගේ ක්‍රියාකාරීත්වය හමුවේ මුස්ලිම්වරුන්ගේ වාණිජ කටයුතුවල සිදු වූ වෙනස්වීම් අධ්‍යයනය කිරීමත්, ඔවුන්ගේ වාණිජ ක්‍රියාකාරකම් පසුකාලීන සමාජ වෙනස්වීම්වලට හේතු සාධකයක් වූයේ ද යන්න අධ්‍යනය කිරීමත් මෙම පර්යේෂණයේ උප අරමුණු වේ.

පර්යේෂණ ක්‍රමවේදය

පුස්තකාල භාවිතය දත්ත රැස්කරන ලද ප්‍රධාන පර්යේෂණ ක්‍රමවේදය යි.ඒ අනුව, සාහිත්‍යමය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන් අධ්‍යයනයෙන් දත්ත රැස්කරගනු ලැබිණි. මෙහි දී මෙරට ඉතිහාසය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කෙරෙන සන්දේශ කාව්‍ය, විදේශ කතුවරුන්ගේ ග්‍රන්ථ, ජාතික ලේඛනාගාර වාර්තා ආදී ප්‍රාථමික හා ද්විතීය මූලාශ්‍රයන් ඇසුරෙන් ද පුරාවිද්‍යාත්මක වශයෙන් කාසි හා ශිලාලේඛන ඇසුරින්ද විශේෂයෙන් අධ්‍යයන කටයුතු කරනු ලැබිණි.

සාකච්ඡාව

ඉන්දියන් සාගරයට යුරෝපීයන්ගේ පැමිණීම ශ්‍රී ලාංකේය ඉතිහාසයේ සුවිශාල වෙනස්කම් රැසක් සිදු කිරීමට සමත් විය. යුරෝපා ආගමනය හමුවේ මුස්ලිම්වරුන් විසින් මෙතෙක් ඉන්දියානු සාගරය තුළ රැකගත් වාණිජ ආධිපත්‍යයට ද ප්‍රබල බලපෑමක් එල්ල විය.

1505 දී පෘතුගීසීන් ලංකාවට පැමිණෙන විට විදේශ වෙළඳාම සම්පූර්ණයෙන් ම මුස්ලිම්වරුන් අත පැවති අතර මහාපරිමාණ අභ්‍යන්තර වෙළඳාම ද බොහෝ දුරට පැවතියේ ඔවුන් අතේ ය. ක්‍රි.ව 1493 දී කොන්ස්තන්තිනෝපලයේ දී යුරෝපීයන් හා තුර්කිවරු (මුස්ලිම්වරුන්) සමඟ ඇති වූ යුද්ධ මාලාව යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීමට ප්‍රධාන හේතුවක් විය. 1505 දී ශ්‍රී ලංකාවට පැමිණි පෘතුගීසිහු ආසියානු වෙළඳ කටයුතුවල දී මුස්ලිම්වරුන් තම වෙළඳ තරඟකරුවන් ලෙසත්, ප්‍රබල ආගමික සතුරන් ලෙසත් සැලකූහ. මුස්ලිම්වරුන් ලක්දිවින් පළවාහැර වෙළඳාම සියතට ගැනීමට ඔවුහු අපේක්ෂා කළේ ය. පෘතුගීසීන්ගේ මුස්ලිම් විරෝධී ක්‍රියාකලාපය හමුවේ ඈත අතීතයේ සිට මුස්ලිම්වරුන් ලක්දිව හා පැවැත් වූ සබඳතාවය මෙකල හුදු වාණිජ විරෝධයක් පමණක් නොව ආගමික විරෝධයක තත්ත්වයට ද පත් වී තිබුණි.

16 - 17 වැනි සියවස් වන විට මුස්ලිම්වරුන් පුත්තලම, හලාවත, මීගමුව, කොළඹ, බේරුවල, ගාල්ල, මාතර ආදී ප්‍රදේශ හා වරාය නගරවල ව්‍යාප්තව සිටියහ. මෙකළ මොවුන් ගම්බද ප්‍රදේශවල තවලම් මඟින් හෝ පා ගමනින් ගොස් වෙළඳාම් කළ අතර වෙළඳ නගරවල ද වෙළඳාම් කරන ලදි. වැඩි වශයෙන් රෙදිපිළි, ලුණු, ලුණු දැමූ මාළු, මී ඉටි ආදිය මෙහි දී වෙළඳාම් කරන ලද බව සඳහන් වේ.

ක්‍රි.ව. 1698 දී සිදු වූ ලන්දේසීන්ගේ ආගමනයත් සමඟ මුස්ලිම්වරුන්ගේ වාණිජ ක්‍රියාකාරීත්වය තව දුරටත් වෙනස්වීම්වලට ලක් විය. මුල දී ලන්දේසීන් හා මුස්ලිම්වරු අතර යහපත් සබඳතා පැවතිය ද, මෙම තත්ත්වය වැඩි කලක් නොපැවතිණි. වාණිජ ක්ෂේත්‍රයේ පැවති එදිරිවාදීකම් හමුවේ ලන්දේසීහු ඇතැම් අවස්ථාවල මුස්ලිම් ප්‍රජාව කෙරේ ඉතා දැඩි පිළිවෙතක් අනුගමනය කරන ලද බව සඳහන් වේ.

යුරෝපාගමනයත් සමඟ මුහුදුබඩ ප්‍රදේශවල මුස්ලිම්වරුන් දැඩි පීඩාවට ලක්

වූ අතර මෙකල මුස්ලිම්වරුන් වැඩි පිරිසක් උඩරට ප්‍රදේශවලට සංක්‍රමණය විය. මේ අවධියේ උඩරට වෙළඳාමේ ප්‍රධාන මැදිහත්කරුවා වූයේ මුස්ලිම්වරුන් ය. ඔවුන් තවලම් මඟින් උඩරට වෙළඳාමේ නිරත වූ අතර යුරෝපීය නාවික හමුදාවල අභියෝගයන්ට මුහුණ දී දේශීය නිෂ්පාදන අපනයනය කිරීමත් රජ වාසල සඳහා අවශ්‍ය සුඛෝපභෝගී ද්‍රව්‍ය, යුද්ධෝපකරණ, රෙදිපිළි ආදී ද්‍රව්‍ය ආනයනය කරමින් බාහිර වෙළඳාමේ ද නිරත විය.

මෙලෙස ක්‍රි.ව. 1796 දී බ්‍රිතාන්‍යයන් ලක්දිවට පැමිණෙන විට මුස්ලිම්වරු ඉතා ක්‍රියාශීලී වෙළඳ ප්‍රජාවක් විය. පෘතුගීසීන් හා ලන්දේසීන් මෙන් නොව බ්‍රිතාන්‍යයන් තම පාලන උපක්‍රමයක් ලෙස මුස්ලිම්වරුන් කෙරෙහි යහපත් ආකල්පයක් දැක්වීය. ඒ අනුව පෙර පැවති තහංචිවලින් ඔවුන් ඉවත් කරනු ලැබ තම වෙළඳ කටයුතු තවදුරටත් ව්‍යාප්ත කරගත් හ. ඒ අනුව, බ්‍රිතාන්‍ය අවධියේ දී මුස්ලිම්වරුන් විසින් සිංකෝනා, අරක්කු, මුතු, මැණික්, දුම්කොළ, පුවක්, කෝපි, තේ, රබර්, කොකෝවා, පොල්, ආදී ද්‍රව්‍ය අපනයනය කළ බව දැක්වේ.

මේ අනුව, 19 වැනි සියවසේ ආර්ථික සංවර්ධනය සඳහා මුස්ලිම්වරුන්ගෙන් දැඩි දායකත්වයක් ලැබුණු බව පෙනේ. තව ද, සමකාලීන ව යුරෝපීයන් විසින් හඳුන්වාදුන් ධනේශ්වර ආර්ථිකය මුස්ලිම්වරුන් විසින් වැළඳගත් අතර එහි ප්‍රතිඵලයක් ලෙස මෙතෙක් ඔවුන් තුළ පැවති අරමුණු හුදු වාණිජ අරමුණක් පමණක් නොවීය. මුස්ලිම්වරුන්ගේ වාණිජ ක්‍රියාකාරීත්වය වෙළඳ තරඟකරුවන්ගෙන් හා දේශීයන්ගෙන් ගැටලු මතුවීමට හේතු වූ අතර මේ තත්ත්වය 1915 සිංහල - මුස්ලිම් කෝලහාලයට ද ඉන් අනතුරුව පැනනැඟි ගැටලුවලට ද සාධකයක් විය. මුස්ලිම්වරුන් ද සිය ආර්ථික සහ ආගමික අවශ්‍යතාවයන් ඉටු කර ගැනීම සඳහා බ්‍රිතාන්‍යයන් කෙරෙහි දැඩි පක්ෂපාතීත්වයක් දැක්වීම පසු කාලීනව ලංකාව තුළ අර්බුද ඇති කිරීමට හේතු වූ බව උපකල්පනය කළහැකිය.

නිගමනය

ශ්‍රී ලංකාව තුළ වෙළඳ ආධිපත්‍යයේ ප්‍රධාන කොටස්කාරයෙකු ලෙස සාමකාමීව කටයුතු කළ මුස්ලිම්වරුන්ගේ වෙළඳ කටයුතු යුරෝපා ආගමනයත් සමඟ ව්‍යාකූල තත්ත්වයකට පත් වූ අතර ක්‍රමයෙන් විවිධ පීඩාවන් මධ්‍යයේ ඉදිරියට ඇදුණු බව පෙනේ.

යටත්විජිත යුගයේ දී වාණිජ කටයුතු උදෙසා මුස්ලිම්වරු, යුරෝපා ජාතීන් මෙන්ම දේශීයන් අතර ඇති වූ තරඟකාරීත්වය හමුවේ එහි ප්‍රතිඵලයක් ලෙස පසුකාලීන සමාජීය සබඳතාවයන්හි අර්බුධයන් ඇති වීමේ මූලාරම්භය සිදු විය. බ්‍රිතාන්‍ය යුගයේ ධනේෂ්වර ආර්ථික ක්‍රමය හමුවේ සිදු වූ විපර්යාසයන් තුළ මෙතෙක් මුස්ලිම්වරුන්ගේ පැවති අරමුණු හුදු වාණිජ අරමුණක් පමණක් ම නොවීය. කෙසේ වෙතත් සමකාලීන ආර්ථික සංවර්ධනයට මුස්ලිම්වරුන් සුවිශාල මෙහෙයක් කළ බව කිව හැකිය. ඒ අනුව, 1505 - 1948 පමණ දක්වා වූ නූතන ඓතිහාසික අවධිය තුළ මුස්ලිම්වරුන්ගේ වාණිජ භූමිකාව පිළිබඳ මනා අවබෝධයක් ලබාගත හැකි බව පෙන්වාදිය හැකිය.

ආශ්‍රිත ග්‍රන්ථ

සිරිවර්ධන,කුමාර.(පරි.).(2005) *ආදම්ගේ පාරාදීසය.* බලංගොඩ: තාරක ප්‍රකාශකයෝ.

ප්‍රේමචන්ද්‍ර, අල්විස්.(පරි.).(2001) *ලෙනාඩ් වුල්ෆ් ලක්බිමේ සත්වසක්.* මරදාන: සූරිය ප්‍රකාශකයෝ.

දසනායක,රෝහිත. (පරි.)(2002)***ඉඳුවර පර්යේෂණාත්මක ලේඛන සංග්‍රහය.***වරකාපොළ: ආරිය ප්‍රකාශකයෝ.

ජයවර්ධන, කුමාරි.(2006)***සොක්කන් ලොක්කන් වූ වගයි (ශ්‍රී ලංකාවේ යටත් විජිත ධනේෂ්වරයේ නැගීම).*** කොළඹ: සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

විජේතුංග,ඩබ්ලිව්.එම්.කේ (සංස්.).(2012) ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරු,***ශ්‍රී ලාංකේය ඉතිහාසය.*** III කාණ්ඩය.කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

Dewaraja, Lorna.(1994)***The Muslims Of Sri Lanka***. Colombo: The Lanka Islamic Foundation.

Shukri, M.A.M.(1986)***Muslims Of Sri Lanka.***Beruwala: Jamiah Naleemia Inst China Fort.